ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.
සමාජ අධ්‍යයන අංශය
තරුණ කටයුතු පිළිබඳ උසස් ඩිප්ලෝමාව - 04 වන මට්ටම
අවසාන පරීක්ෂණය - පළමු අර්ධ වර්ෂය 2024/20225
DSD 4502 ව්‍යාපෘති සැලසුම්කරණය, අධීක්ෂණය සහ ඇගයීම

කාලය: පැය 02යි.

දිනය: 29-03-2025 වේලාව: ප.ව 1.30 - ප.ව 3.30

උපදෙස්

- ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු විසි පහක් (25) හිමි වේ.
- පැහැදිලි අත් අකුරු අපේක්ෂා කෙරේ.

01. (අ) ව්‍යාපෘති සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේදී සම්බන්ධ වන ක්‍රියාකාරකම් විස්තර කරන්න. (ල. 10)

(ආ) ව්‍යාපෘති සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේදී සම්බන්ධ වන විවිධ අදියර පැහැදිලි කරන්න. (ල.15)

02. (අ) තත්ව විශ්ලේෂණයක් (Situational Analysis) සිදු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි පැහැදිලි කරන්න. (ල.10)

(ආ) ශ්‍රී ලංකාවේ තරුණ රැකියා සම්බන්ධයෙන් ආදර්ශ (සාම්පල) තත්ව විශ්ලේෂණ (Sample Situation Analysis) වාර්තාවක් ලියන්න. (ල.15)

03. (අ) පාර්ශවකරුවන් විශ්ලේෂණයක් පැවැත්වීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ල.10)

(ආ) තරුණ තරුණියන්ගේ ප්‍රජනන සෞඛ්‍යය සම්බන්ධ ව්‍යාපෘතියකදී ඔබ සාකච්ඡා කිරීමට කැමති පාර්ශවකරුවන් කෙටියෙන් විස්තර කරන්න. (ල.15)

04. (අ) ව්‍යාපෘතියක අධීක්ෂණය සහ ඇගයීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ල.10)

(ආ) ව්‍යාපෘතියක අවසන් ඇගයීමක් පැවැත්වීමට ඔබ භාවිතා කරන ක්‍රම විස්තර කරන්න. (ල.15)

05. (අ) අරමුදල් යෝජනාවක ඇතුළත් කළ යුතු ප්‍රධාන කරුණු පැහැදිලි කරන්න. (ල. 10)

(ආ) "අයවැය ඉදිරිපත් කිරීම" (Budget Presentation) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි විස්තර කරන්න. (ල. 15)

06. (අ) ව්‍යාපෘති සැලසුම්කරණයේදී ලඝුරාමුවක (Logical Framework) වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 10)

(ආ) ලඝුරාමුවක (Logical Framework) අත්‍යවශ්‍ය අංග විස්තර කරන්න. (ල. 15)

07. (අ) තරුණ තරුණියන් සහ වෘත්තීය අධ්‍යාපනය (Youth and Vocational Education) සම්බන්ධ ව්‍යාපෘතියකදී ඔබ සකස් කිරීමට කැමති අරමුණු විස්තර කරන්න. (ල. 10)

(ආ) මෙම ව්‍යාපෘතිය සඳහා කෙටි තත්ත්ව සහ පාර්ශවකරුවන්ගේ විශ්ලේෂණයක් (Brief Situation and Stakeholder Analysis) ලියන්න. (ල. 15)

08. (අ) ඔබේ ප්‍රදේශයේ තරුණ තරුණියන් අතර ව්‍යවසායකත්ව කුසලතා (Entrepreneurial Skills) ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් සඳහා නියැදි යෝජනාවක් (Sample Proposal) ලියන්න. (ල. 25)

********** සියළුම හිමිකම් ඇවිරිණි ********